අපි අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සමග ගමනක පිටත්ව ගියෙමු. එහි දී ජනයාට දැඩි පීඩාවක් ඇති විය.

සෙයිද් ඉබ්නු අර්කම් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. අපි අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සමග ගමනක පිටත්ව ගියෙමු. එහි දී ජනයාට
දැඩි පීඩාවක් ඇති විය. එවිට අබ්දුල්ලාහ් ඉබ්නු උබෙයි අල්ලාහ්ගේ දූතයාණන් අබියස සිටින්නන් හට ඔවුන් වෙන්ව යන තෙක් ඔබලා වියදම් නොකරනු. තවද මෙසේ පැවසීය. අපි
මදීනාවට නැවත හැරී ගියේ නම් එහි සිටින වැදගත් ජනයා පහත් ජනයා පිටුවහල් කරනු ඇත යැයි පැවසීය. එවිට මම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ ඒ පිළිබඳ එතුමාට දන්වා සිටියෙමි. එවිට එතුමා අබ්දුල්ලාහ් ඉබ්නු උබෙයි වෙත දූතයකු යැවීය. ඔහු සිදු කළ දෑ සම්බන්ධයෙන් ඔහු දැඩි ලෙස දිවුරා සිටියේය. එවිට ඔවුහු, සෙයිද්, අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාට බොරු පැවසීය යැයි පවසා සිටියහ. මා සත්යය කරවමින් අල්ලාහ් "ඉදා ජාඅකල් මුනාෆිකූන්" යන පාඨ පහළ කරන
තෙක්ම ඔවුන් පැවසූ දෑ මාගේ සිතෙහි දැඩිව කා වැදී තිබිණ. පසුව නබි -සල්ලල්ලාහු
අලය්හි වසල්ලම් තුමා ඔවුනට සමාව දෙනු පිණිස ඔවුන්ව කැඳවූහ. නමුත් ඔවුහු ඔවුන්ගේ
හිස් හරවා ගත්තෝය.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

සෙය්ද් ඉබ්නු අර්කම් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. එතුමා නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සමග ගමනක නිරතව සිටියහ. එතුමා සමග දේව විශ්වාසවන්තයින් හා කුහකයින් ද සිටියෝය. එවිට ජනයාට පීඩාකාරී තත්ත්වයක් ඇති විය. එය ඔවුන් ගෙන ගිය කළමනා සම්වබන්ධව හිඟයක් ඇති වූ බැවිනි. එවිට දේව ප්රතික්ෂේපයේ හා කුහකත්වයේ නායකයකු වූ අබ්දුල්ලාහ් ඉබ්නු උබෙය් ඉබ්නු සලූල්, "අල්ලාහ්ගේ දූතයාණන් අබියස සිටින්නන් ඔවුන් වෙන්ව යන තෙක් ඔවුනට ඔබලා වියදම් නොකරනු" (මුනාෆිකූන්: 7) යැයි පවසා සිටියේය. එනම්, ඔවුන් සාගින්නෙන් පෙළී වෙන්ව ගොස් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාව අතහැර දමන තෙක් කිසිදු වියදමක් ඔවුන් වෙනුවෙන් නොකරනු යන්නයි. තවදුරටත් ඔහු: "අපි මදීනාවට පැමිණියේ නම් වැදගත් උදවිය පහත් උදවිය පිටුවහල් කරනු ඇත" යැයිද පවසා සිටියේය. (මුනාෆිකූන්: 8) මෙහි වැදගත් උදවිය ලෙස සලකනු ලැබුවේ තමන් හා තමන්ගේ පිරිසයි. පහත් අය ලෙස සලකනු ලැබුවේ අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාය. මෙය සෙයිද් ඉබ්නු අල්අර්කම් -රළියල්ලාහු අන්හු- තුමාගේ කණට වැකුණි. පසුව එතුමා අබ්දුල්ලාහ් ඉබ්නු අබී ඉබ්නු සලූල් තුමා මේ මේ අයුරින් පවසා සිටි බව නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ එතුමාට දන්වා සිටියේය. පසුව ඔහු (කුහකයින්ගේ නායකයා) එසේ නොපැවසූ බවට දිවුරා සිටියේය. එය කුහකයින්ගේ සිරිතක් විය. ඔවුන් දැන දැනම බොරුව මත දිවුරා සිටිති. ඒ අනුව තමන් නොපැවසූ බවට ඔහු දිවුරා සිටියේය. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමාද මතුපිටින් එය පිළිගත්තද එහි ඇතුළාන්තය අල්ලාහ් වෙත අතහැරියේය. එය සෙයද් ඉබ්නු අල් අර්කම් තුමාට දැන ගන්නට ලැබුණු විට එය එතුමාට බැරෑරුම් කරුණක් විය. හේතුව එම පුද්ගලයා අල්ලාහ්ගේ දූතයාණන් අබියස දිවුරා සිටිමින් ඔහුගේ දිවුරුමෙහි ඔහු තරයේම සිටි බැවින් ඔවුහු සෙයිද් ඉබ්නු අල් අර්කම් අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමාට බොරු පවසා ඇතැයි පැවසූ බැවිනි. එනම් සෙය්ද් තුමා නබි තුමාණන් වෙත ගෙන ආ

පණිවිඩය මුසාවක් යැයි පැවසූහ. අල්ලාහ් "ඉදා ජාඅකල් මුනාෆිකූන්" යන පාඨය ප්රකාශ කරමින් නිර්දෝෂීබව තහවුරු කරමින් එය පැහැදිලි කරන තෙක් සෙයිද් ඉබ්නු අල් අර්කම් තුමාට එය මහත් කරුණක් විය. පසුව නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඔහු කළ නොමනා කතාව හේතුවෙන් ඔවුනට සමාව පිරිනමනු පිණිස කුහකයින් හා ඔවුන්ගේ නායක අබ්දුල්ලාහ් ඉබ්නු උබය්ව කැදවා සිටියහ. නමුත් ඔවුන් තුළ තිබූ අහංකාරය හා නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා තමන් වෙනුවෙන් අල්ලාහ්ගෙන් පාපක්ෂමාව ඉල්ලා සිටීම තමන්ට අවමානයක් යැයි සිතූ බැවින් එයින් ඔවුන් වැළකී සිටියහ.

http://www.sunnah.global/hadeeth/si/show/3861